# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

COVID-19 වසංගතය මගින් ඇතිවූ අහිතකර බලපෑම නිසා නිෂ්පාදන ක්‍රියාකාරකම් සැලකියයුතු ලෙස පහළ යන ලදී. නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2020 මාර්තු මාසයේදී දර්ශකාංක 23.6 කින් පහළ යමින් දර්ශක අගය වූ 30.0 ක් බවට පත්වූ අතර එය මෙතෙක් වාර්තා කළ අඩුම අගය වේ. COVID-19 වසංගතය මගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශය කෙරෙහි ඇති බලපෑම පිළිබිඹු කරමින්, නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක වල සිදුවූ සැලකිය යුතු පහළ යාම, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම පහළ යාම සඳහා ප්‍රධාන ලෙස හේතු විය.


**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**30.0**

**2020 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 23.6 ක පහළ යාමකි.**

මාර්තු මස මැද සිට ඇඳිරි නීතිය පැනවීමත් සමග නිෂ්පාදන අංශයේ සමාගම් වසා දැමීමට සිදුවීම, නිෂ්පාදනයේ සිදුවූ සැලකිය යුතු පහළ යාමට හේතු විය. තවද, මෙම සමාගම් වසා දැමීම නිසා නිෂ්පාදන ක්‍රියාවලිය ඇණහිටීමත් සමගම නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම්හි සැලකිය යුතු පහළ යාමක් සිදු විය. තවද, මාර්තු මස මුල් කාලයේ ඇමරිකා එක්සත් ජනපදයෙන් සහ යුරෝපා රටවලින්, විශේෂයෙන්ම, රෙදිපිළි හා ඇඟළුම් සඳහා ලැබුණු ඇණවුම්, එම රටවල වෛරසයේ සිදුවූ ව්‍යාප්තියත් සමගම අවලංගු කර ඇත.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාමාන්‍යයෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයෙහි ඉහළ යාම තුළින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනය සමග අමු ද්‍රව්‍ය කෙරෙහි ඇතිවන ඉල්ලුම ඉහළ යාම පිළිබිඹු කළද, මාර්තු මාසයේ මෙලෙස ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට වැඩි කාලයක් ගතවී ඇත්තේ COVID-19 වසංගතය ව්‍යාප්තිය සමග නැව් භාණ්ඩ ප්‍රවාහනයේ සහ දේශීය වශයෙන් භාණ්ඩ ප්‍රවාහනයේ සිදුවූ ප්‍රමාදයන් හේතුවෙනි.

| විචලයය | පෙබ. | මාර්තු | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **53.6** | **30.0** | **-** | **ඉහළ යාමක සිට පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 51.1 | 18.7 | - | ඉහළ යාමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 54.8 | 5.2 | - | ඉහළ යාමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.3 | 44.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 52.2 | 12.7 | - | ඉහළ යාමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 66.1 | 85.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම සාධකයන් හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස 2020 මාර්තු මාසයේදී පහළ යාමක් පෙන්නුම් කරන ලදී.

නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, නව කොරෝනා වෛරසය මගින් ගෝලීය සැපයුම් පද්ධතිය මෙන්ම ඉල්ලුම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. එබැවින්, ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5 කින් ඉහළ යමින් 2020 මාර්තු මාසයේදී 47.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 මාර්තු මාසයේදී, චීනයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ ගිය අතර ඉන්දියාවෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මන්දගාමී විය. යුරෝපා කලාපය, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ රුසියාවෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක කඩඉම් මට්ටමට වඩා අඩු මට්ටමක තවදුරටත් පැවතිණි.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 අප්‍රේල් 15 වන දිනට*


---

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

COVID-19 වසංගතය තුළින් ආර්ථිකයෙහි සේවා අංශයට සිදු වූ අහිතකර බලපෑම පිළිබිඹු කරමින්, 2020 මාර්තු මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශකාංක 32.0 දක්වා සැලකියයුතු ලෙස පහළ ගිය අතර, එය 2015 මැයි මාසයෙන් පසුව වාර්තා වූ අවම දර්ශක අගය යි. නිමකිරීමට නියමිත කාර්යයන් හැර සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උපදර්ශක කඩඉම් මට්ටම වන දර්ශකාංක 50.0ට වඩා සැලකියයුතු ලෙස පහළ මට්ටමක පැවතීම තුළින් මෙම වසංගත තත්ත්වය මගින් සේවා අංශයෙහි කටයුතුවලට සිදු වූ පුළුල් බලපෑම පෙන්නුම් කෙරේ.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2020 පෙබරවාරි මාසයට සාපේක්ෂව |
|---|---|
| **32.0** | **දර්ශකාංක 18.2ක පහළ යාමකි.** |

සංචාරක කර්මාන්තයට සම්බන්ධ හෝටල්, සංචාරක නියෝජිතයන් සහ විනෝදාත්මක කටයුතු වැනි සේවාවන්හි නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්හි අඩු වීමක් වාර්තා විය. මීට අමතරව, රට වසා දැමීමත් (lockdown) සමග පනවන ලද අභ්‍යන්තර ගමනාගමන සීමාවන් සහ නැව් භාණ්ඩ මෙහෙයවීම් පහළ යෑම ප්‍රවාහන උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට අහිතකර ලෙස බලපාන ලදී. පාරිභෝගිකයන් භාණ්ඩ තොග රැස්කිරීමත් සමග තොග සහ සිල්ලර වෙළඳ අංශයෙහි ඉල්ලුම් වර්ධනයක් දැකිය හැකි වුවද, සේවකයන් ගෙන්වා ගැනීමේ සහ බෙදාහැරීම් ජාලවල පැවති දුෂ්කරතා හේතුවෙන් එම ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට අපොහොසත් වී ඇත. අභිමත ලෙස සිදු කරනු ලබන වියදම් අඩු කිරීම සහ පෞද්ගලික ආදායමෙහි පහළ යෑම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුමෙහි පහළ යෑමක් අපේක්ෂා කිරීම, ආනයන සීමා කිරීම් සහ සංචාරක පැමිණීම් පහළ යෑම පිළිබඳව ප්‍රතිචාර දක්වන්නන්ට ඇති ගැටලු හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකය 2020 මාර්තු මාසයේ දී ඉතිහාසයේ අවම දර්ශක අගය වාර්තා කරන ලදී. මේ අතර, නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ පහළ යෑම සමග කොන්ත්‍රාත් සහ අනියම් සේවකයන්ගේ සේවය අත්හිටුවීම; සහ නව බඳවාගැනීම් නතර කිරීම හේතුවෙන් සේවා අංශයෙහි සේවා නියුක්තිය අඛණ්ඩව පහළ යන ලදී.



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **50.2** | **32.0** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 52.7 | 25.7 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 53.8 | 17.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.2 | 34.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.8 | 65.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 52.7 | 16.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වුවද, 2020 මාර්තු මාසයේ දී සේවා අංශයෙහි නිමකිරීමට නියමිත කාර්යයන් උපදර්ශකයෙහි සැලකියයුතු ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, සන්නිවේදන, සෞඛ්‍ය සහ ප්‍රවාහන උපඅංශවල අවම සේවක සංඛ්‍යාවක් යොදා ගනිමින් අත්‍යවශ්‍ය ව්‍යාපාරික කටයුතු පමණක් සිදු කිරීම මේ සඳහා හේතු විය.

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, නව කොරෝනා වසංගතයෙහි බලපෑම හේතුවෙන් අඛණ්ඩව දෙවන මාසයටත් කඩයිම් මට්ටම වන 50.0ට පහළ මට්ටමක පවතිමින්, 2020 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 47.1 හි සිට 2020 මාර්තු මාසයේ දී 37.0 දක්වා පහළ යන ලදී. සේවා නියුක්තිය දශකයකින් වාර්තා කළ වේගවත්ම පහළ යෑම වාර්තා කළේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 මාර්තු මාසයේ දී පහළ ගිය බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, අප්‍රේල් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවති ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.